# විසිතුරු මල් ආශ්‍රිත ජාත්‍යන්තර වෙළඳාම

විසිතුරු මල් වගාව සඳහා යෝග්‍ය පාරිසරික සම්පතින් මෙන්ම මානව සම්පතින් පෝෂිත වුව ද, ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින විසිතුරු මල් ආශ්‍රිත ජාත්‍යන්තර වෙළඳ පොලේ ශ්‍රී ලංකාවේ පංගුව ඉතා සීඝ්‍රයෙන් පහල වැටෙමින් පවතී. 1991 වන විට, යුරෝපයට විසිතුරු මල් අපනයනය කරන ලද රටවල් අතර අටවෙනි ස්ථානයේ පසු වූ ශ්‍රී ලංකාව අභිබවා මේ වනවිට රටවල් බොහොමයක් ඉදිරියට ගොස් පැවතීමෙන් ඒ බැව් මනාව පැහැදිලි වේ. ඇමරිකන් ඩොලර් බිලියන 40ක් පමණ වන වටිනාකමක් සහිත ජාත්‍යාන්තර විසිතුරු මල් වෙළඳපොලේ මේ වනවිට විශාල පරිවර්තනයන් සිදුවෙමින් පවතී. ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, චීනය සහ අප්‍රිකානු රටවල් බොහොමයක් ඉතා තරඟකාරී ලෙස ජාත්‍යාන්තර විසිතුරු මල් වෙළඳපොළට අවතීර්ණ වෙමින් සිටී. ජාත්‍යාන්තර විසිතුරු මල් අපනයන වෙළඳපොලේ එම රටවල පංගුව දිනෙන් දින වැඩිවෙමින් පවතින බව වාර්තා වේ. මෙම ලිපියේ අරමුණ වන්නේ විසිතුරු මල් ආශ්‍රිත ජාත්‍යාන්තර වෙළඳාම සහ එහි ප්‍රවනතාවයන් පිළිබඳ සාකාච්ජා කිරීමයි.

ලෝකයේ විසිතුරු මල් වෙළඳාමේ යෙදී සිටින රටවල් සංඛ්‍යාව 95 ක් පමණ වේ. ආරක්ෂිත සහ විවෘත වශයෙන් විසිතුරු මල් වගාව සඳහා යොදාගෙන තිබෙන ලෝකයේ භූමි ප්‍රමාණය හෙක්ටයාර් 223105 පමණ වෙතැයි ගණන් බලා තිබේ. මෑතක දී කරන ලද අධ්‍යයනයකට අනුව, ලෝකයේ විසිතුරු මල් වෙළඳාම වාර්ෂිකව 10% ක පමණ වේගයකින් වර්ධනය වෙමින් පවතී. මෙහි සංවර්ධනය වෙමින් පවතින රටවල කොටස 20% ක් පමණ වේ.

පසුගිය කාලය තුළ ලෝකයේ විසිතුරු මල් වෙළඳාම ස්ථාවර වර්ධනයක් පෙන්වා ඇති අතර අනාගතයේ ඇතිවිය හැකි නිශ්චිත ඉල්ලුම් වර්ධනයක් අපේක්ෂාවෙන් එය තවදුරටත් වර්ධනය වනු ඇති බව අනුමාන කෙරේ. විසිතුරු මල් සඳහා පවතින ලෝකයේ විශාලම ආනයනික වෙළඳපොල වන්නේ ජර්මනියයි. 1995 දී ජර්මනිය විසින් ආනයනය කරන ලද විසිතුරු මල්වල වටිනාකම ඇමරිකන් ඩොලර් මිලියන 2000 ක් වූ අතර එය එම වසර තුළ ලෝකයේ සමස්ථ විසිතුරු මල් ආනයන වටිනාකමින් 30% ක් පමණ විය. ඇමරිකානු එක්සත් ජනපදය දෙවන

වගු අංක 1

**ඒක පුද්ගල විසිතුරු මල් පාරිභෝජනය සහ සමස්ථ වෙළඳපොළ වටිනාකම**

| රට | ඒක් පුද්ගල පාරිභෝජනය (ඇමරිකන් ඩොලර්) | ජනගහනය (මිලියන) | සමස්ථ වෙළඳපොල වටිනාකම (ඇමරිකන් ඩොලර් මිලියන) |
|---|---|---|---|
| ස්විට්සර්ලන්තය | 167 | 7.08 | 1183 |
| නෝර්වේ | 160 | 4.33 | 693 |
| ඕස්ට්‍රියාව | 105 | 7.99 | 836 |
| ජර්මනිය | 94 | 81.34 | 7607 |
| ස්වීඩනය | 85 | 8.82 | 752 |
| ඩෙන්මාර්කය | 80 | 5.2 | 416 |
| නෙදර්ලන්තය | 77 | 15.45 | 1191 |
| බෙල්ජියම | 66 | 10.49 | 690 |
| ෆින්ලන්තය | 66 | 5.09 | 335 |
| ප්‍රංශය | 66 | 58.11 | 3828 |
| ඉතාලිය | 60 | 58.26 | 3496 |
| ඇමරිකා එක්සත් ජනපදය | 55 | 263.81 | 14,586 |
| ජපානය | 43 | 125.51 | 5397 |
| බ්‍රිතාන්‍ය | 29 | 58.30 | 1680 |
| ස්පාඤ්ඤය | 24 | 39.40 | 950 |
| වෙස් සමූහාණ්ඩුව | 9 | 10.43 | 92 |
| ග්‍රීසිය | 3.1 | 10.65 | 332 |
| අයර්ලන්තය | 1.2 | 3.55 | 44 |
| චීනය | 00.40 | 1203.10 | 488 |
| සමස්ත වෙළඳ පොළ එකතුව | | | 5,449,596 |

**මූලාශ්‍රය: එක්සත් ජාතීන්ගේ පොදු වෙළඳ දත්ත බැංකුව -1996**

දැනට ලෝකයේ ප්‍රධාන වශයෙන්ම විසිතුරු මල් නිෂ්පාදනය කෙරෙන රටවල් ලෙස සැලකෙන්නේ ජපානය, නෙදර්ලන්තය සහ ඇමරිකා එක්සත් ජනපදයයි. ඕලන්ද මල් කවුන්සිලයේ දත්තයන්ට අනුව ලෝකයේ විසිතුරු මල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ ඉහළම ඒක පුද්ගල පාරිභෝජනය දක්වන රටවල් වන්නේ ස්විට්සර්ලන්තය, නෝර්වේ, ඕස්ට්‍රියාව සහ ජර්මනිය යන රටවල්ය. වගු අංක 1 න් දැක්වෙන්නේ ලෝකයේ ඒක පුද්ගල විසිතුරු මල් පාරිභෝජනය සහ වෙළඳපොළ තත්ත්වය විග්‍රහ කිරීමකි.

**ජී. චතුර ජයම්පති ද සිල්වා**
*පර්යේෂණ නිලධාරී*
**වාරි, ජල පාලන හා ගොවිජන සම්බන්ධතා අංශය**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.**

විශාලතම ආනයනකරුවා වුව ද, එහි ආනයනික පංගුව සුළු වශයෙන් අඩුවෙමින් පවතී. මෙයට අමතරව ලෝකයේ විසිතුරු මල් නිෂ්පාදනයෙන් ප්‍රංශය 11% ක් පමණ ද, නෙදර්ලන්තය සහ එංගලන්තය යන රටවල් විසින් 9% ක් පමණ වූ ප්‍රතිශතයක් බැගින් ද, ආනයනය කරනු ලබයි. මෙම රටවල් පහ විසින් සිදු කෙරෙන ආනයනවල වටිනාකම සමස්ථ ලෝක ආනයනයෙන් 70% ඉක්මවනු ලබයි.

ලෝකයේ ප්‍රධාන වශයෙන් කැපූ මල් නිෂ්පාදනය කරන රට ලෙස සැලකෙන්නේ නෙදර්ලන්තය යි. ඒ සඳහා නෙදර්ලන්තය යොදාගෙන ඇති භූමි ප්‍රමාණය හෙක්ටයාර් 8,107 කි. කෙසේ වෙතත්, මෙම භූමි ප්‍රමාණය මෙන් තුන් ගුණයකට ආසන්න ප්‍රමාණයක් පමණ එනම්, හෙක්ටයාර් 21,218 ක් උපයෝගී කර ගනිමින් ජපානයේ නිෂ්පාදනය කෙරෙන කැපූ මල් ප්‍රමාණය නෙදර්ලන්තයට වඩා අඩුය. මෙයට හේතුව නෙදර්ලන්තයේ ඉහළ ගොවිපල ඵලදායීතාවයයි.

**වගු අංක 2**

## විසිතුරු මල් නිෂ්පාදනය කෙරෙන භූමි ප්‍රමාණයන්

| | ආරක්ෂිත (හෙක්ටයාර්) | විවෘත (හෙක්ටයාර්) | එකතුව (හෙක්ටයාර්) |
|---|---|---|---|
| **යුරෝපය** | | | |
| නෙදර්ලන්තය | 5518 | 2499 | 8017 |
| ඉතාලිය | 4402 | 3252 | 7654 |
| එක්සත් ජනපදය | 859 | 5945 | 6804 |
| ජර්මනිය | 2713 | 3908 | 6621 |
| ස්පාඤ්ඤය | 2442 | 1788 | 4230 |
| ප්‍රංශය | 1747 | 2048 | 3795 |
| බෙල්ජියම | 542 | 1100 | 1642 |
| හංගේරියාව | - | - | 1050 |
| ග්‍රීසිය | - | - | 882 |
| පෝලන්තය | - | - | 807 |
| ඔස්ට්‍රියාව | 216 | 529 | 745 |
| ඩෙන්මාර්කය | 330 | 353 | 683 |
| ස්විට්සර්ලන්තය | 272 | 373 | 644 |
| නෝර්වේ | - | - | 310 |
| අයර්ලන්තය | 49 | 251 | 300 |
| ෆින්ලන්තය | - | - | 144 |
| ස්වීඩනය | 27 | 89 | 116 |
| **යුරෝපයේ එකතුව** | - | - | **44444** |
| **උතුරු ඇමරිකාව** | | | |
| එක්සත් ජනපදය | 7121 | 9279 | 16400 |
| මෙක්සිකෝව | 800 | 4200 | 5000 |
| කැනඩාව | 988 | | 988 |
| **උතුරු ඇමරිකාවෙ එකතුව** | - | - | **223888** |
| **ආසියා සහ ශාන්තිකර කළාපය** | | | |
| චීනය | - | - | 59527 |
| ඉන්දියාව | - | - | 34000 |
| ජපානය | 10,048 | 11170 | 21218 |
| ඉන්දුනීසියාව | - | - | 10000 |
| තායිලන්තය | - | - | 7000 |
| තායිවානය | - | - | 4033 |
| කොරියාව | 2229 | 1718 | 3947 |
| මලයාසියාව | - | - | 1286 |
| පිලිපීනය | - | - | 670 |
| හොංකොං | - | - | 343 |
| ශ්‍රී ලංකාව | - | - | 200 |
| සිංගප්පූරුව | - | - | 162 |
| **ආසියාවෙ සහ ශාන්තිකර කලාපයේ එකතුව** | - | - | **13,3386** |
| **මැද පෙරදිග සහ අප්‍රිකාව** | | | |
| ඊශ්‍රායලය | - | - | 1950 |
| කෙන්යාව | 350 | 850 | 1200 |
| සිම්බාබ්වේ | 245 | 997 | 942 |
| තුර්කිය | - | - | 700 |
| මොරොක්කෝ | - | - | 450 |
| උගන්ඩාව | - | - | 40 |
| **මැද පෙරදිග සහ අප්‍රිකා එකතුව** | - | - | **5282** |
| **මධ්‍ය සහ දකුණු ඇමරිකාව** | | | |
| බ්‍රසීලය | 10285 | | 10285 |
| කොලොම්බියාව | 4716 | 47 | 4757 |
| ඉක්වදෝරය | - | - | 1185 |
| ආජන්ටිනාව | - | - | 800 |
| ගෝතමාලාව | - | - | 605 |
| **එකතුව** | - | - | **17605** |
| **සමස්ත එකතුව** | - | - | **223105** |

මූලාශ්‍රය: එක්සත් ජාතීන්ගේ පොදු වෙළඳ දත්ත බැංකුව - 1996

වගු අංක 2 හි දක්වා ඇත්තේ 1995 සංඛ්‍යා ලේඛන වලට අනුව ලෝකයේ විසිතුරු මල් නිෂ්පාදනය සඳහා වෙන් වූ භූමි ප්‍රමාණයන් පිළිබඳ විස්තරයකි.

ලෝකයේ ප්‍රධාන කැපූ මල් ආනයනය කරන රටවල් වන්නේ නෙදර්ලන්තය, කොලොම්බියාව, ඉතාලිය, ඩෙන්මාර්කය, ඇමරිකා එක්සත් ජනපදය, බෙල්ජියම, ඊශ්‍රායලය සහ කෙන්යාවයි.1990 වසරේ දී හෙක්ටයාර් 3691 ක් වූ කොලොම්බියාවේ විසිතුරු මල් සහ පැලෑටි වගාව සඳහා වෙන් වූ භූමි ප්‍රමාණය 1996 වන විට 29% ක වර්ධනයක් පෙන්වමින් හෙක්ටයාර් 4.757ක් දක්වා වැඩි විය. කොලොම්බියානු විසිතුරු මල් හා පැලෑටි නිෂ්පාදනයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ වන්නේ එහි ශ්‍රමය සාපේක්ෂව ලාභ වීම, යෝග්‍ය දේශගුණික තත්ත්වයක් පැවතීම, අඩු ප්‍රාග්ධන පිරිවැය, ඉහළ නිෂ්පාදන ගුණත්වය සහ නිෂ්පාදකයින් සඳහා සම්පූර්ණයෙන් උෂ්ණත්වය පාලනය කරන ලද තත්ත්වයන් තුළ ගොවිපලේ සිට ගුවන් තොටුපොළ දක්වා සිය නිෂ්පාදන ප්‍රවාහනය කිරීමේ සහ බෙදා හැරීමේ පහසුකම් රජය විසින් ලබාදීම යනාදියයි.

එක්සත් ජාතින්ගේ සංවිධානයේ විසිතුරු මල් වෙළඳාම පිළිබඳ දත්තයන්ට අනුව ඉක්වදෝරය, සිම්බාබ්වේ, බෙල්ජියම වැනි රටවල් පසුගිය කාල පරිච්ඡේදය තුළ කැපූ මල් අපනයනයේ විශාල ප්‍රගතියක් දක්වා තිබේ. ජාත්‍යන්තර කැපූ මල් අපනයන වෙළඳපොලේ ඉන්දියාවේ කොටස 1% කටත් වඩා අඩුය. එසේ වුවද, මෙම කර්මාන්තය තුළින් පසුගිය වසර කිහිපය තුළ එරට විසින් උපයන ලද ආදායම 563% ක පමණ වර්ධන වේගයක් පෙන්වා තිබීම විශේෂයෙන්ම කැපී පෙනෙන්නකි. ඒ සඳහා ක්‍රමවත් සැලසුම් රාජ්‍ය සහයෝගය සහ වෙනත් සංවර්ධන ආයතනයන්ගේ සහයෝගය ද ලැබී තිබේ.

ලෝකයේ ඉතා වැදගත්ම විසිතුරු මල් ආනයනකරු ලෙස සැලකෙන ජර්මනිය සිය ආනයනයන්ගෙන් 87% ක් නෙදර්ලන්තයෙන් ද, තවත් 5.5% ක් අනෙකුත් යුරෝපීය රටවල් වලින් ද, ආනයනය කරන අතර බැහැරින් ආනයනය කෙරෙන්නේ 7.5% ක් පමණි. යුරෝපයේ විශාලම විසිතුරු මල් ආනයන - කරු පමණක් නොව විශාලතම පාරිභෝගිකයා වන්නේ ද ජර්මනියයි. සමස්තයක් ලෙස ජර්මනියේ සෑම පවුලක් මෙන්ම විසිතුරු මල් සහ පැලෑටි මිල දී ගැනීමට හුරුවී සිටින අතර ඔවුන්ගේ ත්‍යාග හුවමාරු කර ගැනීම් අතර ද විසිතුරු මල් සහ පැලෑටි වලට මූලික ස්ථානයක් ලැබී තිබේ. කෙසේ වෙතත්, ජර්මනිය තුළ වඩාත් ඉහළ ඉල්ලුමක් පවතින්නේ මධ්‍යම මිල ගණන් වලට අලෙවි කෙරෙන විසිතුරු මල් සඳහාය. ජර්මනිය තුළ වසර පුරාම මල් වලට ඉල්ලුමක් තිබේ. එසේ වුව ද, මැයි - සැප්තැම්බර් කාලය තුළ මල් සඳහා වන ඉල්ලුම කිසියම් ප්‍රමාණයකට අඩුවීමක් දැකිය හැකිය. තව ද, නිවාඩු සහ උත්සව කාලයන්හි දී විශාල ලෙස ඉල්ලුමෙහි වැඩි වීමක් දක්නට ලැබේ. ජර්මනියේ වඩාත්ම ජනප්‍රියව ඇත්තේ රෝස සහ කානේෂන් යන මල් වර්ග වන අතර රතු රෝස මල් සඳහා ඉල්ලුම 50% කටත් වැඩි වූවකි.

ජර්මනිය සංවර්ධනය වෙමින් පවත්නා රටවල් වලින් සෘජුවම මල් ආනයනය කිරීම සඳහා වැඩි කැමැත්තක් දැක්වීම විශේෂත්වයකි. මේ වනවිටත් ඉන්දියාව ජර්මන් වෙළඳපලට විශාල වශයෙන් මල් අපනයනය කරනු ලබයි. ජර්මනිය තුළ ආනයනික මල් බෙදා හැරීමට කඩිනම් ක්‍රමෝපායයන් යොදා තිබීම හේතුවෙන් මේවායේ නැවුම් බව සමඟම පාරිභෝගිකයන් අතට පත් වේ. මේ නිසා මල් වලට පවතින ඉල්ලුම වැඩිවීම සෘජුවම ජර්මනියට මල් අපනයනය කිරීමේ නිරත රට වලට ඉතා වාසිදායක වී තිබේ.

මල් සඳහා වන ඉල්ලුමෙන් 95% ක් පමණ දේශීය නිෂ්පාදනයෙන් සම්පූර්ණ වුව ද, ලෝකයේ හත්වන විශාලතම මල් ආනයනික රට වන්නේ ජපානයයි. ජපානයේ හෙක්ටයාර 10,000 ක පමණ භූමි ප්‍රමාණයක ඉදිවී ඇති හරිතාගාර තුළ විසිතුරු මල් නිෂ්පාදනය සිදු කෙරේ. ජපානයේ මල් වගාකරුවන් සාපේක්ෂ වශයෙන් වැඩිමහළු වූවන් වීමත්, තරුණයන් ඒ සඳහා වැඩි නැඹුරුවක් නොදැක්වීමත් හේතුවෙන් ජපානයේ මල් සඳහා වන ආනයනික වෙළඳපොල අනාගතයේ දී පුළුල් වනු ඇති බවට නිසැකවම අනුමාන කල හැකිය. තව ද, ජපානයේ වඩාත්ම ජනප්‍රිය මල් වර්ග වන්නේ ක්‍රිෂන්තිමම්, රෝස, කානේෂන් සහ ඕකිඩ් යන වර්ගයන් ය. ජපන් ජාතිකයන් වඩාත් ඇලුම් කරන්නේ සුදු පැහැති මෘදු පෙති සහිත මල් වර්ගයන්ට වේ. ජපානය ප්‍රධාන වශයෙන්ම සිය ආනයනික මල් අවශ්‍යතාවයන් සපුරා ගන්නේ නෙදර්ලන්තයෙන් වුවද, මේ වනවිට ඉන්දියාව ඉතා වේගයෙන් ජපන් වෙළඳපොල දිනා ගනිමින් සිටී. නෙදර්ලන්තයට වඩා නැවුම් බවකින් යුක්තව මෙන්ම සාපේක්ෂව වඩා අඩු වියදමකින් ද යුතුව ආනයනය කිරීමේ හැකියාව හේතුවෙන් ජපානය ද ඉන්දියාව කෙරෙහි වැඩි නැම්යාවක් දක්වනු ලබන බව පෙනේ.

නෙදර්ලන්තය ලෝකයේ ප්‍රධාන විසිතුරු මල් අපනයනකරුවකු මෙන්ම ප්‍රමුඛ ආනයනකරුවෙක් ද වේ. මෙරට බෙහෙවින්ම සිදු කෙරෙන්නේ ආනයනික මල් අපනයනය කිරීමයි. නෙදර්ලන්තයට මෙන්ම ඊශ්‍රායලය, කොලොම්බියාව වැනි රට වලට ලෝක වෙළඳපොලේ ඉහළ ඉල්ලුමක් පවතී. ඊට හේතුව, එම රටවල නිෂ්පාදන උසස් තත්ත්වයේ පැවතීමයි. දැනට දැඩි තරඟකාරීත්වයක් පවතින යුරෝපය, උතුරු ඇමරිකාව වැනි වෙළඳපොලවල් හැරුණු විට, විසිතුරු මල් සඳහා ලෝකයේ තවත් බොහෝ වෙළඳපොලවල් නිර්මාණය වෙමින් තිබේ. දැනටමත් සැලකිය යුතු මට්ටමකින් සිය නිෂ්පාදනය සහ අපනයන ශක්තිය ගොඩනගා ගෙන ඇති ඉන්දියාව වැනි නව තරඟකාරී රටවල් වලට මෙන්ම ශ්‍රී ලංකාව වැනි විසිතුරු මල් අපනයන වෙළඳාමේ ළදරු අවධියේ පසුවන රටවල් ද කළ යුත්තේ උසස් තත්ත්වයේ නිෂ්පාදනයන් තරඟකාරී මිලකට ඉහත වෙළඳපල වලට සැපයීමට උනන්දුවීමයි. මේ සඳහා ක්‍රමවත් සැලසුම් සහ රාජ්‍ය සහාය ලැබීම අත්‍යාවශ්‍ය වේ.